**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2021**

**--------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 හි 09 ඡේදය ප්‍රකාරව ආයෝජනයක් අත්පත් කරගත් දිනයේ සිට මාස 03ක් හෝ ඊට අඩු කාලයක් වැනි කෙටි කල්පිරීමේ කාලයක් පවතින අවස්ථාවලදී මුදල් හා මුදල් සමාන දෑ ලෙස දැක්විය යුතු වුවද, මාස 03 න් කල් පිරෙන රු.51,146,913ක තැන්පතුවක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ද, මාස 06 න් කල් පිරෙන රු.41,011,616ක තැන්පතුවක් මුදල් හා මුදල් සමාන දෑ යටතේ ද දක්වා තිබුණි. මේ නිසා රු.78,196,312ක් විය යුතු ආයතනයේ මුදල් හා මුදල් සමාන දෑ රු.68,061,016ක් වශයෙන් රු.10,135,296ක් අඩුවෙන් ද, ආයෝජන ක්‍රියාකාරකම් රු.41,011,616 ක් වැඩියෙන් ද දැක්වුණි. | සිදු වී ඇති අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා කටයුතු කරන්නෙමු. | ප්‍රමිතියෙහි උපදෙස්වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.18,270,361ක් වූ වර්ග 03 කට අයත් වත්කම් අයිතම 753 ක් භාවිතයට ගනිමින් පැවතියද එම වත්කම්වල ඵලදායී ජීවකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 03 අනුව නැවත සංශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම කාර්යය 2022 වසර තුළ දී තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් හෝ වෙනත් කමිටුවක් මඟින් ඉටුකර ගෙන 2022 ගිණුම් ප්‍රකාශන වලට ඇතුළත් කර නිවැරදි කරමි. | වත්කම්වල ඵලදායී ජීවකාලය සංශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 47 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණන අගය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වන දේපළ පිරියත හා උපකරණ සෑම වර්ෂ 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.590,807,810ක් වූ දේපළ පිරියත හා උපකරණ 2014 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ මිල නොසිතූ ලෙස ඉහළ යාම හේතුවෙන් වර්තමාන අගයන් බොහෝ සේ විචලනයන් සිදු වී ඇති බැවින්, වත්කම් නැවත ප්‍රත්‍යාගණනයට ලක් කර, ගිණුම් වාර්තාවන්ට ඇතුළත් කිරීම සඳහා පියවර ගන්නෙමු. | ප්‍රමිතිය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජංගම නොවන වත්කමක් වූ අප ජලය බැහැර කිරීමේ පද්ධතිය ඉදිකිරීම හා නේවාසිකාගාර නල පද්ධතිය පුනරුත්ථාපනය කිරීමේ රු.4,706,344ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | එම කාර්ය අවසන් වූ පසු ජංගම නොවන වත්කමක් ලෙස ගිණුම්ගත කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | කෙරීගෙන යන වැඩ ජංගම වත්කම් යටතේ ගිණුම්ගත නොකළ යුතුය. |
| (ආ) ජාතික වැවිලි කළමණාකරන ආයතනයේ පිරිවැටුම ප්‍රමාණවත් නොවීම මත 2020 ජනවාරි 01 දින සිට එකතු කළ අගය මත බදු ලියාපදිංචිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අක්‍රිය කර තිබුණු නමුත් රු.4,506,771ක හිලව් බද්දක් ජංගම වත්කමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලින් වසර 02ක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පැවති අතර එය අයකර ගත හැකි ශේෂයක් නොවන බවට විගණනයේදී නිරීක්ෂණය විය. | මෙය නැවත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීමට නොහැකි බැවින්, ආයතනයේ ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු කරමි. | යොමුගත වටිනාකම අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2022 වර්ෂයේ මාස 09ක් තුළ අවස්ථා 37කදී බැංකුවට බැරවී තිබුණු තැන්පතු රු.280,539 ක් හඳුනාගෙන නියමිත ගිණුමට බැර කිරීමට කටයුතු නොකර විවිධ පුහුණු ආදායම් ගිණුමට බැරකර තිබුණු අතර එහි | පාඨමාලා ගාස්තු සිසුන්ගේ සහතික නිකුත් කිරීමේ දී තහවුරු කරන බැවින්, ඒ අවස්ථාවේ දී සෘජු බැංකු ගෙවීම් හඳුනා ගැනීමටත්, කෙටි කාලීන වැඩමුළු පැවැත්වීම සඳහා | බැංකුවට සෘජු ලැබීම් ඒ ඒ මාසයේ බැංකු සැසඳුම සකස් කරන අවස්ථාවේදී හඳුනාගෙන නියමිත ගිණුමට ගැලපිය |

| | | |
|---|---|---|
| නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. | වන මුදල් ප්‍රේෂණ ගෙන්වා ගැනීම මඟින් නිරවුල් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | යුතුය. |
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තාව අනුව රු.1,273,060ක් වූ රෙදිපිළි හා ඇඳ ඇතිරිලි තොගය රු.1,294,402ක් වශයෙන් රු.21,342ක් වැඩියෙන් ද, රු.761,649ක් වූ මුලුතැන්ගෙයි උපකරණ තොගය රු.719,557ක් වශයෙන් රු.42,092ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි. | සමීක්ෂණ වාර්තාවට ඇතුළත් කර නොමැති දෙනියාය පුහුණු මධ්‍යස්ථානයේ භාවිතයට ගත නොහැකි ඇඳ ඇතිරිලි සහ කොට්ට උර තොග ගිණුම් පොත්වලින් ලියා හැරීමටත්, වියදම් ලෙස ලියාහැර ඇති පාරිභෝජන ද්‍රව්‍ය තොගය නැවත තොග ගිණුමට ඇතුළත් කිරීමටත් කටයුතු කරමි. | තොග සමීක්ෂණ වාර්තාව අනුව අදාළ තොග ගිණුම් ගැලපිය යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ලැබිය යුතු ශේෂයන් 31ක එකතුව | 5,895,445 | ශේෂ සනාථ කිරීම් | ණයගැතියන් වෙත නැවත ශේෂ තහවුරු කිරීමේ නිවේදන යැවීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂයන් සඳහා සනාථ කිරීම් ලබා ගැනීමට සහ එම ශේෂ අයකර ගැනීමට ද විධිමත් පියවර ගත යුතුය. |
| (ආ) ගෙවිය යුතු ශේෂයන් 07ක එකතුව | 20,857,889 | ශේෂ සනාථ කිරීම් | නැවත ශේෂ තහවුරු කිරීමේ නිවේදන යැවීමට කටයුතු කරමි. | ගෙවිය යුතු ශේෂයන් සනාථ කර ගැනීමටත් එම ශේෂ නිරවුල් කිරීමටත් කටයුතු කළ යුතුයි. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් 04 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති පාඨමාලා ගාස්තු රු.221,072 ක් 2022 වර්ෂයේදී කපාහැර තිබුණු අතර තවත් ණයගැතියන් 09 දෙනෙකුගෙන් වසර 01ත් 04ත් අතර කාලයක සිට හිඟහිටව ඇති රු.493,390 ක් ක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ සහ පාලක මණ්ඩල අනුමැතිය යටතේ අයකරගත නොහැකි ශේෂයන් ලියා හැර ඇත. වර්ෂය ඉක්ම වූ ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති,රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11(ආ) වගන්තිය, 2004 ජූනි 29 දිනැති අංක 25 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2006 ජූනි 27 දිනැති අංක PE/PE/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ව්‍යවසායන්හි මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවද, ආයතනය විසින් තැන්පත් කළ 2021 දෙසැම්බර් 31 දිනට රු.175,231,464 ක් වූ ස්ථාවර තැන්පතු ආයෝජනයන් සඳහා එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ආයතනයේ ඉඩම් කොටසක් ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත පවරා ගැනීම වෙනුවෙන් රජය මගින් ගෙවන ලද රු.මි. 155ක වන්දි මුදල සහ රු.මි. 42ක ප්‍රමාද ගාස්තුව පුහුණු පහසුකම් සංවර්ධනය කිරීමේ අනුමත ව්‍යාපෘතියට යෙදවීමට සැලසුම් කර කොටස් කරමින් ලංකා බැංකුවේ තැන්පත් කර ඇත. අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. | මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ. 371 | ලබාගත් අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 21කදී නිලධාරීන් වෙත ලබාදී තිබූ රු.532,760ක අතුරු අග්‍රිම පියවීමට දින 34ත් 268ත් අතර කාලයක් ගත කර තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය තුළ බොහොමයක් අත්තිකාරම් පියවීම ප්‍රමාද විය. ප්‍රමාදයන් මඟ හරවා ගැනීම වෙනුවෙන් කටයුතු කරන්නෙමු. | අතුරු අග්‍රිම අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,202,306ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.96,815,868ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.77,613,562ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මුළු ආදායම රු.70,511,198 කින් පහළ යාමත්, මුළු වියදම රු.7,102,363කින් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේදි ප්‍රාග්ධන ප්‍රදාන රු.8,250,000 කින් හා පුහුණු ආදායම රු.6,982,592 කින් ඉහළ ගොස් තිබුණද නේවාසිකාගාර පහසුකම් කුලී ආදායම හා පොලී ආදායම පිළිවෙලින් රු.4,080,585 කින් හා රු.3,985,061 කින් අඩුවීම සහ පසුගිය වර්ෂය හා සැසඳීමේදී විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ රජයේ ප්‍රදානය වූ රු.80,817,397ක් නොලැබීම හේතුවෙන් මුළු ආදායම රු.70,511,198 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 7:1ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එම අගය 10:1ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ දැනුම්දීම මත 2017 වර්ෂයේදී ජාතික වැවිලි කළමනාකරණ ආයතනයට ලබාදී ඇති ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු කැබ් රථ දෙකක් විධිමත් පරිදි පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණු අතර එම වාහන අලුත්වැඩියා හා නඩත්තු කිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.2,320,042ක් වැය කර තිබුණි. | මෙම කැබ් රථ දෙකෙහි ලියාපදිංචි අයිතිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙත පවරා ගැනීම සඳහා රු.මිලියන 3.7ක තක්සේරු වටිනාකම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ගෙවීම පිණිස පාලක මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර එකී මුදල ගෙවීමෙන් අනතුරුව වාහනයේ ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | විධිමත් පරිදි වාහන පවරා ගත යුතුය. |
| (ආ) දේශනශාලා සහ පර්යේෂණ හා පුහුණු ඒකකය ඇතුළත් නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වියදම් පියවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.159,907,714ක ස්ථාවර තැන්පතුවක් මුදල් කරගෙන තිබුණු අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇති බවට නිරීක්ෂණය නොවීය. | පාලක මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රමාණ බිල්පත් ගෙවීම සඳහා මුදල් තැන්පත් කර ඇති බැවින්, එම ගෙවීම් සඳහා මුදල් කරන අවස්ථාවේ දී නැවත පාලක මණ්ඩල අනුමැතියක් අවශ්‍ය නොවේ. | තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ඇස්තමේන්තුගත ආදායම රු.199,111,000ක් වුවද, තත්‍ය ආදායම රු.139,830,000ක් වීමෙන් සියයට 30කින් ඇස්තමේන්තුගත ආදායමට ලඟාවීමට නොහැකි වී තිබුණු අතර නේවාසික පහසුකම් කුලී ආදායම් හා පුහුණු ආදායම් පිළිවෙලින් සියයට 85 කින් හා සියයට 53 කින් අඩු වීම ඒ කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. තවද, වියදම් ශීර්ෂ 03ක ඇස්තමේන්තුගත වියදම රු.48,163,000ක් වුවද, තත්‍ය වියදම රු.18,408,000ක් හෙවත් සියයට 38ක් වීමෙන් රු.29,755,000ක හෙවත් සියයට 62 ක විචලනයක් නිරීක්ෂණය වූ අතර වියදම් ශීර්ෂ අතර එම විචලතාවය පිළිවෙලින් සියයට 53ක්, 77ක් හා 92ක් විය. මේ හේතුවෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කිරීමට වූ කාර්යය සීමාසහිත විය. ශිෂ්‍යයන්ගෙන් අය කරන මුදල් ද මාර්ගගත ක්‍රමය හේතුවෙන් අඩු කිරීමට සිදු විය. මාර්ගගත ක්‍රමය ඔස්සේ වැඩමුළු රාශියක් සංවිධානය කර අය කරන ගාස්තුව අඩු අගයක් ගැනීම මත පුහුණු ආදායම් අඩුවීම කෙරෙහි බලපා ඇත.<br>වියදම් විචලනය සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |

| | | |
|---|---|---|
| යොදාගෙන නොමැති බවට නිරීක්ෂණය විය. | | |
| (ආ) නිපුනතා සංවර්ධන, අධ්‍යයන පාඨමාලා, තාක්ෂණ සංවර්ධන සහ කළමනාකරණ සංවර්ධන වශයෙන් වැඩසටහන් 26ක් සිසුන් 510කගේ සහභාගීත්වයෙන් පවත්වා රු.48,530,000ක ආදායමක් ඉපැයීමට අපේක්ෂා කර තිබුණ ද, උපයා තිබුණු ආදායම රු.22,880,000ක් හෙවත් අපේක්ෂිත ආදායමෙන් සියයට 47ක් විය. සැලසුම් කළ වැඩසටහන් 09ක් පැවැත්වීමට නොහැකි වීමත්, වැඩසටහන් 03ක අපේක්ෂිත සිසුන් ප්‍රමාණය සහභාගි නොවීමත්, වැඩසටහන් 02ක සහභාගි වූ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වුවද, එක් සිසුවෙකුගෙන් අය කිරීමට අපේක්ෂා කරන ලද ගාස්තුව පිළිවෙලින් සියයට 32කින් හා සියයට 28කින් අඩුවෙන් අය කිරීමත් ඊට හේතුවී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ ආකාරයට වැඩසටහන් නොපැවැත් වූ අතර පවත්වනු ලැබූ වැඩසටහන මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්වීම නිසා ගාස්තුව සංශෝධනය කරන ලදී.<br>අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ සිසුන්100 ක් බඳවා ගැනීමට සැලසුම් කළ ද තෝරා ගනු ලැබූ සිසුන් 76දෙනා වෙනුවෙන් රු.9,123,960ක් ගෙවීමට අධ්‍යාපන අමාත්‍යාංශය එකඟතාවය පල කර ඇත. | සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී පැනනගින තත්ත්වයන් කළමනාකරණය කර ගනිමින් ඉලක්කයන් ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සිසුන් 130 කගේ සහභාගීත්වයෙන් වර්ෂය තුළ පැවැත්වීමට සැලසුම් කර තිබූ පාඨමාලා 06ක් පවත්වා නොතිබීමෙන් එමගින් අපේක්ෂිත ආදායම රු. මිලියන 41.58ක් උපයා ගැනීමට සහ අපේක්ෂිත දැනුම සමාජගත කිරීමට නොහැකි වී තිබුණි. මේ කෙරෙහි බලපෑ හේතූන් පිළිබඳව සොයා බලා නිසි පිළියම් යෙදූ බවට නිරීක්ෂණය නොවීය. | උපාධි පිරිනැමීමේ බලය ලබා දීම සඳහා නියාමනය කිරීමේ බලතල පැවරීමේ ආයතනය වන අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පිරිනැමීමේ අවසරය මෙතෙක් ලබා දී නොමැති අතර එය ලද පසු ආයතනයේ පනත සංශෝධනය කර වැවිලි බෝග තාක්ෂණ සහ කළමනාකරණ විද්‍යාවේදී උපාධිය ආරම්භ කිරීමට අදාළ කටයුතු සිදුකෙරේ .<br>NVQ 05 සුදුසුකම් සම්පූර්ණ කළ සියළුම සිසුන් උපාධි පාඨමාලාවට සම්බන්ධ වීමට කැමැත්ත ප්‍රකාශ කළ බැවින්, වැවිලි ව්‍යාපෘති කළමණාකරන උසස් ජාතික ඩිප්ලෝමාව (NVQ 06) ආරම්භ නොකෙරුණි.<br>වැවිලි ගිණුම්කරණ මූල්‍ය සහ පිරිවැය කළමණාකරන උසස් සහතිකපත්‍ර පාඨමාලාව මාර්ගස්ථ ක්‍රමය යටතේ හැදෑරීමට අපහසු හෙයින් කොවිඩ් තත්ත්වය හමුවේ ආරම්භ නොකරන ලදී. | තාත්වික සැලසුම් සකස් කිරීම හා පැනනගින තත්ත්වයන් කළමනාකරණය කර ගනිමින් වැඩසටහන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සිසුන් සංඛ්‍යාව අඩු වූ බැවින් ශුද්‍ර මූල්‍ය කළමණාකරනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව නතර කර ඇත. | |
| (ඇ) වැවිලි කළමනාකරණ ඩිප්ලෝමා වැඩසටහන සහ ප්‍රායෝගික තේ පරීක්ෂණ පිළිබඳ වෘත්තීය වැඩසටහන වශයෙන් සිසුන් 10ක් සහභාගී කරවාගෙන විදේශ වැඩසටහන් 02ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණු නමුත් අයදුම්කරුවන් ඉදිරිපත් වී නොතිබීම හේතුවෙන් ඒවා පැවැත්වීමට නොහැකි වී තිබුණු අතර පසුගිය වර්ෂ 02ක් තුළදී ද සැලසුම් කළ විදේශ වැඩසටහන් පවත්වා නොතිබුණි. මේ කෙරෙහි බලපෑ හේතූන් පිළිබඳව සොයාබලා නිසි පිළියම් යොදා ඇති බවට නිරීක්ෂණය නොවුණු අතර එමගින් උපයා ගැනීමට අපේක්ෂිත ආදායමද සැලසුම්කර නොතිබුණි. | 2019 වර්ෂයේදී පැවති ත්‍රස්තප්‍රහාර හා 2020 හා 2021 වර්ෂයන්හි කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරණයක් ලබා දුන්න ද මේ සඳහා ප්‍රමාණවත් සහභාගිවන්නන් ප්‍රමාණයක් නොලැබුණි. | තාත්වික සැලසුම් සකස් කිරීම හා පැනනගින තත්ත්වයන් කළමනාකරණය කර ගනිමින් වැඩසටහන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ 70 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් තත්‍ය කාර්ය මණ්ඩලය 55ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02ක්, තෘතීය මට්ටමේ තනතුරු 02 ක්, ද්විතීය මට්ටමේ තනතුරු 01ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 10ක් වශයෙන් 2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පවතින තනතුරු 15ක් අවශ්‍යතාවය අනුව සම්පූර්ණ කර ගැනීමට හෝ තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ උග්‍ර සේවක හිඟයක් පැවතිය ද, රජයේ නිකුත් කර ඇති චක්‍රලේඛ හේතුවෙන් බඳවා ගැනීම් නතර කර ඇත. ආයතනයේ කාර්ය මණ්ඩලය වර්ධනය කර ගැනීම අරමුණු කොට ගනිමින් ඉල්ලුම් කරන ලද තනතුරු 24ක් අතරින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද තනතුරු 10ක් සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියට අනුමැතිය ලබා ගැනීම පිණිස 2021.02.18 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | ආයතනයේ අවශ්‍යතාවය මත තනතුරු ප්‍රමාණය සංශෝධනය කර ගැනීමට හෝ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |